# ශ්‍රී ලංකා ගුවන් නියමුවන්ගේ සංසදය එ. ශ්‍රී ලංකා ගුවන් සේවය (Airlines Pilot Guild v Sri Lankan Airlines)

RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම)/99/2017 - 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන් හි (ගාස්තු සහ අභියාචනා කාර්යයපටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යයපටිපාටිය -

මෙම අභියාචනා විභාගය 13.11.2017, 08.01.2018, 06.02.2018, 23.03.2018, 2.04.2018 හා 09.05.2018 දිනයන්හි පැවති කොමිෂන් සභා රැස්වීම් වල කොටසක් ලෙස පවත්වන ලදී.
12.06.2018 දින කරන ලද නියෝගය

**සභාපති** - මහින්ද ගම්මන්පිල
**කොමිෂන් සභා සාමාජික** - ජොෂ්ඨ නීතීඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සාමාජික** - ජොෂ්ඨ නීතීඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සාමාජික** - ආචාර්ය සෙලවී තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සාමාජික** - විනිසුරු රෝහිනී වල්ගම

**පෙනීසිටීම**
අධ්‍යක්ෂ ජනරාල් - පියතිස්තස රණසිංහ මහතා
**නෛතික පර්යේෂක -** මතුරි මාරන් මහත්මිය

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය: | 29.06.2017 |
| තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය: | 19.07.2017 |
| නම්කළ නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය: | 02.08.2017 |
| නම්කළ නිලධාරියා තීරණය ලබා දුන් දිනය: | 23.08.2017 |
| RTIC කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය: | 15.09.2017 |
| ලිඛිත දේශනා/ වැඩිදුර ලිඛිත දේශනා ඉදිරිපත් කිරීම: | |
| අභියාචක - 04.12.2017/18.01.2018/14.02.2018;<br>පොදු අධිකාරිය - 05.01.2018/05.02.2018/20.02.2018 | |

**අභියාචක වෙනුවෙන් පෙනී සිටීම**
ජනාධිපති නීතිඥ නලින් ලද්දුවහෙට්ටි මහතා
නීතිඥ හෆීල් ෆරිස් මහතා
නීතිඥ ශමීර් සවාහිර් මහතා
නීතිඥ තරිඳි විජයපුර
බුද්ධික චන්ද්‍රසේකර

**පොදු අධිකාරිය වනුවෙන් පෙනී සිටීම**
නීතිඥ ආචාර්ය ශිවාජි පීලික්ස්

**අභියාචක පාර්ශවයේ නියෝජනය -**
කපිතාන් රුවන් විතානගේ, සභාපති, ශ්‍රී ලංකා ගුවන් නියමුවන්ගේ සංසදය
කපිතාන් මලික් ලතීෆ්, ශ්‍රී ලංකා ගුවන් නියමුවන්ගේ සංසදය
එස්. එම්. කංකානම්ගේ මිය, ශ්‍රී ලංකා ගුවන් නියමුවන්ගේ සංසදය

**පොදු අධිකාරියේ නියෝජනය -**
එම්. ඒ. රණසිංහ, සමූහ ප්‍රධානි - නෛතික, ශ්‍රී ලංකා ගුවන් සේවය
ශියාරා සෙල්ලමුත්තු මිය, සමූහ නෛතික කටයුතතු කළමනාකාරිනී, ශ්‍රී ලංකා ගුවන් සේවය

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**
අභියාචක, පහත සඳහන් තොරතුරු පොදු අධිකාරියෙන් ඉල්ලා සිටින ලදී.

1. ශ්‍රී ලංකා ගුවන් සේවයේ සේවය කරන පහත නම් සඳහන් නිලධාරීන්ගේ වැටුප් සහ වෙනත් ප්‍රතිලාභ/ දීමනා
   a. විධායක නිලධාරී
   b. මානව සම්පත් කළමනාකරණ ප්‍රධානී (HHR)
   c. ප්‍රධාන වෙළඳ නිලධාරී (CCO)
2. ශ්‍රී ලංකා ගුවන් සේවය සහ පාකිස්ථාන අන්තර්ජාතික ගුවන් සේවය (PIA) අතර සිදුවූ ලිපි හුවමාරුවට අදාළ/ සම්බන්ධ සියලු තොරතුරු
3. පාකිස්ථාන අන්තර්ජාතික ගුවන් සේවය, ශ්‍රී ලංකා ගුවන් සේවය සමඟ එළැඹුණු මූලික ගිවිසුමේ සහ එයට අදාළ/ සම්බන්ධ සියලු තොරතුරු
4. පාකිස්ථාන අන්තර්ජාතික ගුවන් සේවය, ශ්‍රී ලංකා ගුවන් සේවය සමඟ එළැඹුණු මූලික ගිවිසුමට/ එකඟවීමට අදාළ මූල්‍යමය තොරතුරු (ලාභ/ අලාභ සහ වන්දි මුදල් ඇතුළු අනෙකුත් තොරතුරු)
5. පාකිස්ථාන අන්තර්ජාතික ගුවන් සේවය, ශ්‍රී ලංකා ගුවන් සේවය සමඟ එළැඹුණු මූලික ගිවිසුම අවසන් කිරීමට අදාළ/ සම්බන්ධ සියලු තොරතුරු
6. Airbus A350 ගුවන් යානා ඇනවුම අවලංගු කිරීමට අදාළ/ සම්බන්ධ සියලු තොරතුරු (ගිවිසුම්/ ලිපි හුවමාරු කිරීම් ඇතුළු අනෙකුත් තොරතුරු)
7. විධායක නිලධාරී සුරේන් රත්වත්තේ මහතාගේ A320 jet conversion ගුවන් යානයේ පෞද්ගලික පියාසර පුහුණුව සඳහා ශ්‍රී ලංකා ගුවන් සේවයට/ වෙනත් පාර්ශව වලට දැරීමට සිදුවූ පිරිවැයට අදාළ/ සම්බන්ධ සියලු තොරතුරු

අභියාචක 29.06.2017 දින මුල් තොරතුරු ඉල්ලීම ඉදිරිපත් කරන ලදී. තොරතුරු නිලධාරී 30.06.2017 දින ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට අභියාචකට දැන්වූ අතර, 19.07.2017 දිනැති ලිපියෙන් පවසා සිටියේ මෙම තොරතුරු ඉල්ලීම් වල අයිතම් 4 සහ 6 ට අදාලව තොරතුරු වලින් කොටසක් ලබා දිය හැකි අතර අනෙකුත් තොරතුරු ඉල්ලීම් පනතේ 5(1) වගන්තිය ප්‍රකාරව ප්‍රතික්ෂේප කරන බවයි.

පොදු අධිකාරිය තොරතුරු ඉල්ලීම පනතේ පහත වගන්ති ප්‍රකාරව ප්‍රතික්ෂේප කරන ලදී. තොරතුරු ඉල්ලීමේ අයිතම් අංක 1 ට අදාලව 5(1)(අ) සහ 5(1)(උ) වගන්ති ද, අයිතම් අංක 2 සිට 5 ට අදාලව 5(1)(ආ)(ii) සහ 5(1)(ඇ) වගන්ති ද, අයිතම් අංක 6 ට අදාලව 5(1)(i), 5(1)(ඇ) සහ 5(1)(ක) වගන්ති ද, අයිතම් අංක 7 ට අදාලව 5(1)(අ) සහ 5(1)(උ) වගන්ති පෙන්වා දෙන ලදී.

තොරතුරු නිලධාරී ලබාදුන් පිළිතුර පිළිබඳව සෑහීමකට පත් නොවූ අභියාචක, 02.08.2017 දින නම්කළ නිලධාරී වෙත අභියාචනාවක් ඉදිරිපත් කරන ලද්දේ විමසා සිටින ලද තොරතුරු මහජන සුභසිද්ධිය සැලකිල්ලට ගනිමින් ඉදිරිපත් කල යුතු බවත්, තොරතුරු නිලධාරී ලබා දුන් තොරතුරු සාවද්‍ය සහ නොමඟ යවන සුළු වන බවත් පවසමිනි. මෙයට පිළිතුරු ලබා දුන් නම් කල නිලධාරී 23.08.2017 දිනැති ලිපියෙන් අයිතම් අංක 1 සහ 6 ට අදාලව තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කල අතර, අයිතම් 2 සිට 5 දක්වා ඉල්ලා සිටින තොරතුරු වල සීමා නිර්ණයක් නොමැති බව පෙන්වමින් පවසා සිටියේ, ඉල්ලා සිටින ලද සියලුම තොරතුරු ලබාදීම් දෙරට, එනම් ශ්‍රී ලංකාව සහ පාකිස්ථාන අතර සම්බන්ධතාවය පළුදු වීමට හේතු විය හැකි බවයි. මෙම පිළිතුර මගින්ද සෑහීමකට පත් නොවූ අභියාචක, 15.09.2017 දින කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කරන ලදී.

**අභියාචනා අවස්ථාවේ උද්ගත වූ කාරණා:**
අභියාචක පාර්ශවයේ නීතිඥවරයා පවසා සිටියේ පොදු අධිකාරිය තොරතුරු ලබාදීමේදී විනිවිධභාවයකින් කටයුතු කිරීමට අපොහොසත් වූ හෙයින් මෙම අභියාචනාව ගොනු කල බවයි. පොදු අධිකාරියේ වාර්ෂික වාර්තා සැලකිල්ලට ගැනීමේදී ඔවුන් සෑම වර්ෂයකම සැලකිය යුතු අලාභ තත්ත්වයන්ට ගොදුරු වී ඇති බව පෙනී යයි. අභියාචක සංසදයේ සාමාජිකයින්ගේ වැටුප් පොදු අධිකාරීය විසින් ගෙවනු ලබන අතර මෙම සාමාජිකයින් ශ්‍රී ලංකා පුරවැසියන් වන හෙයින් සහ පොදු අධිකාරිය මහජන මුදල් භාවිතයෙන් කටයුතු කරන හෙයින් මෙම තොරතුරු පිළිබඳව අභියාචක පාර්ශවය උනන්දුවක් දක්වයි. මෑතකදී සිට පොදු අධිකාරිය මුහුණ පෑ අලාභය වඩාත් නරක අතට හැරෙමින් පවතින අතර, පසුගිය වසර 10 – 15 අතර කාලය තුල පොදු ආයතනය තුල සිදුවන අක්‍රමිකතා සහ ඥාති සංග්‍රහයට අනුව සිදුවන කටයුතු හේතුවෙන් මෙම තත්ත්වය වඩාත් බරපතල අතට හැරෙමින් පවතින බවට පොදු මාධ්‍යයේ පුළුල් ලෙස වාර්තා වී ඇත.

ශ්‍රී ලංකා ගුවන් සේවය කලකට ඉහත දී ලෝකයේ හොඳම ගුවන් යානා සේවාවන් 10 න් එකක් ලෙස නම් දරා සිටි අතර, වර්තමානයේ සිදුවන කළමනාකරණ අක්‍රමිකතා සහ දූෂණය මෙම අධිකාරිය ඉතාමත් ඛේදනීය තත්ත්වයකට පත්කර ඇත. පොදු අධිකාරිය මෙම හේතුව නිසා පාඩු ලබන බවට පවසන පදනම ප්‍රශ්න කරමින් අභියාචක තවදුරටත් පවසා සිටියේ මේ හේතුවෙන් ගුවන් මගීන් ප්‍රමාණය අඩුවීම සාක්ෂි ලෙස ඉදිරිපත් කර නොමැති බවයි.
තවද පොදු අධිකාරිය පාකිස්ථාන අන්තර්ජාතික ගුවන් සේවය සමඟ ඇතිකරගත් ගිවිසුම වැනි වූ වෙනත් පාඩු ලබන ගිවිසුම් වලටද එළඹෙන අතර, මේවා ශ්‍රී ලංකාව තුළදී සාර්ථකව නිමවූ කටයුතු ලෙසට ප්‍රශංසාවට ලක් කරන බවට පෙන්වා දුන් අභියාචක වැඩිදුරටත් පවසා සිටියේ පාකිස්ථාන ගිවිසුමේ එරට අත්සන්කරු අපරාධ විමර්ශනයකට ලක්ව ඇති බවත්, එම මතභේදය හේතුවෙන් මෙම ගිවිසුම අවලංගු කර ඇති බවත්ය.
අභියාචක තවදුරටත් පෙන්වා සිටියේ 2016 අංක 12 දරන පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කර හැකි නමුත්, 5(4) වගන්තිය ප්‍රකාරව මහජන සුභසිද්ධිය උදෙසා මෙම තොරතුරු ඉදිරිපත් කර හැකි බවයි. එම වගන්තිය මෙසේ සඳහන් කරයි.

*"(1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුවද මහජන සුභසිද්ධිය එම තොරතුරු හෙළිදරව් කිරීමෙන් වන හානියට වඩා වැඩි නම් එවැනි තොරතුරු සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප නොකළ යුතුය"*
පොදු අධිකාරිය මෙයට පිළිතුරු දක්වමින් පවසා සිටියේ 02.08.2017 දිනැති ලිපියෙන් පාකිස්ථාන අන්තර්ජාතික ගුවන් සේවය සමඟ ගිවිසුමෙන් ලැබූ ආදායම් තොරතුරු ලබා දුන් බවත් මෙය තොරතුරු ඉල්ලීමේ අයිතම් 4 සහ 6 ට අදාලව තොරතුරු වලින් කොටසක් වූ බවයි. එනම්;

4 වැනි අයිතමට අදාලව - ශ්‍රී ලංකා ගුවන් සේවය පාකිස්ථාන අන්තර්ජාතික ගුවන් සේවය සමඟ ගිවිසුමෙන් ලැබූ මුළු ආදායම

6 වැනි අයිතමට අදාලව - A350 – 900 ගුවන් යානා ඇනවුම අවලංගු කිරීමට වැයවූ පිරිවැය

මෙම තොරතුරු ලබාදීම පිළිබඳව 19.07.2017 දින අභියාවකට දැන්වූ අතර, 02.08.2017 දින අභියාවකහට එම තොරතුරු ලබාදුන් බවට පොදු අධිකාරිය පවසා සිටියේය.

අභියාවක විසින් ඉල්ලුම් කරන ලද 6 වැනි අයිතමට අදාළ තොරතුරු පොදු අධිකාරිය සහ තුන්වන පාර්ශවයක් (Airbus සහ AerCap) අතර ඇතිවූ ගිවිසුමකට සම්බන්ධ වන හෙයින් පනතේ 29 වගන්තිය ප්‍රකාරව එම තොරතුරු අභියාවකට ලබා දීම පිළිබඳව තුන්වන පාර්ශවයේ කැමැත්ත දැනගැනීමට තොරතුරු නිලධාරියා විසින් 19.07.2017 දින ලිපියක් ඉදිරිපත් කර ඇත. එදිනම එම ලිපියට පිළිතුරු දැක්වූ තුන්වන පාර්ශවය පවසා ඇත්තේ ඉල්ලුම් කල තොරතුරු ලබා දීමට ඔවුන් එකඟ නොවන බවයි. මේ පිළිබඳව නම්කළ නිලධාරී 19.07.2017 දිනැති ලිපියෙන් අභියාවාක පාර්ශවයට (ලිපි සහිතව) දැන්වූ බව පොදු අධිකාරිය තව දුරටත් පවසා සිටියේය.
මෙයට පිළිතුරු දක්වමින් අභියාවක පවසා සිටියේ ඉල්ලුම් කරන ලද තොරතුරු වල අනාවරණය සැලකිය යුතු මට්ටමකට මහජන සුභසිද්ධිය සඳහා බලපාන හෙයින් තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීම සාධාරණ නොවන බවයි. අභියාවක තවදුරටත් පවසා සිටියේ මෙම තොරතුරු ඉල්ලීම ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, තොරතුරු ඉල්ලීම ඉදිරිපත් කළ පාර්ශවයට එරෙහිව විරෝධතාවක් ආයතනය තුල ක්‍රියාත්මක වූ බවයි. පොදු අධිකාරිය මත තිබූ විශ්වාසය පළුදු වීම හේතුවෙන් ගුවන් නියමුවන් 80 කට ආසන්න සංඛ්‍යාවක් ඇති ශ්‍රී ලංකා ගුවන් සේවයෙන් ඉවත්ව ගොස් ඇති බවට අභියාවක චෝදනා කළේය.

අභියාවකගේ තොරතුරු ඉල්ලීම සළකා බැලීමෙන් අනතුරුව එහි අන්තර්ගතය ඉතාමත් පුළුල් බව නිගමනය කල කොමිෂන් සභාව අභියාවකට 13.11.2017 දින පවසා සිටියේ පොදු මාධ්‍යයෙන් ලබා ගත හැකි තොරතුරු තමන් සතු කර ගැනීමෙන් අනතුරුව ලබා ගැනීමට අවශ්‍ය අනෙකුත් තොරතුරුවල ඉතාමත් පැහැදිලි සහ සංක්ෂිප්ත තොරතුරු ඉල්ලීමක් 04.12.2017 දින වන විට ඉදිරිපත් කරන ලෙසටයි. (13.11.2017 දින කොමිෂන් සභා වාර්තාව). නියෝග කල පරිදි අභියාවක විසින් සංක්ෂිප්ත තොරතුරු ඉල්ලීම 04.12.2017 දින කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී. කෙසේ වෙතත් සංක්ෂිප්ත තොරතුරු ඉල්ලුමේ නව තොරතුරු ඉල්ලා සිටින බවට පවසා පොදු අධිකාරිය විරෝධතාවක් දැක්වූ හෙයින් ( 05.01.2018 දින කොමිෂන් සභාවට ඉදිරිපත් කල ලිඛිත දේශනය) මුල් තොරතුරු ඉල්ලීමට අනුව අභියාවනය ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාව තීරණය කරන ලදී. (08.01.2018 දින කොමිෂන් සභා වාර්තාව)

06.20.2018 දින පොදු අධිකාරිය මූලික විරෝධයක් ඉදිරිපත් කරමින් පවසා සිටියේ මෙම අභියාවනය පවත්වාගෙන යාමට පනතේ 43 වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අධිකරණ බලයක් නොමැති බවයි. එයට හේතු දක්වමින් පොදු අධිකාරිය පවසා සිටියේ පනතේ 43 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරිය “2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වූ” ලෙස නිර්වචනය කර ඇති බවත්, මෙම අධිකාරිය සමාගම් පනත යටතේ “නැවත ලියාපදිංචි” වූ අධිකාරියක් වන බවයි.

පාර්ශව දෙකෙහිම කරුණු සලකා බැලීමෙන් අනතුරුව 23.03.218 දින තීරණය ඉදිරිපත් කල කොමිෂන් සභාව මූලික විරෝධතාවය (http://www.rticommission.lk/web/images/pdf/23032018/ul-rticappea-jurisidiction-point-22032018.pdf) නිෂ්ප්‍රභා කරමින් පවසා සිටියේ ශ්‍රී ලංකා ගුවන් සේවය පනතේ 43 වන වගන්තියට යටත් වන බවයි.

20.04.2018 දින විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් පොදු අධිකාරිය කොමිෂන් සභාව මූලික විරෝධතාවය පිළිබඳව ලබා දුන් නියෝගය පිළිගන්නා බවත් එයට අභියාචනයක් ඉදිරිපත් නොකරන බවත් පවසා සිටියේය.
පොදු අධිකාරිය විසින් අයිතම් අංක 6 ට අදාළ තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් (පනතේ 5(1)(ක) වගන්තිය ප්‍රකාරව), අදාළ තොරතුරු, තීරණයක් නොමැති අමාත්‍ය මණ්ඩල සංදේශයක අඩංගු වන බව සනාථ කිරීමට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට කොමිෂන් සභාව නියෝග කර සිටින ලදී.

**නියෝගය:**
මෙම පනතේ ප්‍රධාන පරමාර්ථය, එහි සාරාංශගත විධිවිධාන වලින් සවිස්තරාත්මකව දක්වා ඇති පරිදි සහ පූර්විකාවේ අවධාරණය කර ඇති පරිදි, *"පොදු අධිකාරිවල විනිවිදභාවය සහ වගකීම් පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගී ඇති බැවින්, එමඟින් ශ්‍රී ලංකාවේ මහජනතාවට යහපාලනය සඳහා වැඩි වශයෙන් සහභාගී විය හැකි සහ රටේ පොදු ජන ජීවිතයේදී සක්‍රීය ලෙස සහභාගී විය හැකි සමාජයක් ප්‍රවර්ධනය කිරීම"* පෙන්වා දිය හැකිය.

පොදු ආයතන වල විනිවිදභාවය හා වගවීම පනතේ කේන්ද්‍රීය අවධානය වේ. ඒ සම්බන්ධයෙන් පනතේ පූර්විකාව, උපරිම වශයෙන් තොරතුරු හෙළිදරව් කිරීමේ මූලධර්මය පදනම් කොටගෙන කටයුතු කරයි.

ඉන්දියාවේ තොරතුරු දැනගනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත (2005) පනතේ ඇති "ගැටුම්කාරී අවශ්‍යතා තුලනය කිරීම" යන මූලධර්මය; එනම්, "... සීමිත මූල්‍ය සම්පත් ප්‍රශස්ථ ව භාවිතා කිරීම සහ සංවේදී තොරතුරු පිළිබඳ රහස්‍යභාවය සුරකින කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය සම්බන්ධව තොරතුරු හෙළිදරව් කිරීම, අනෙකුත් පොදු අවශ්‍යතා සමග ගැටීමට ඉඩ ඇති බැවින්, මෙම ගැටුම්කාරී අවශ්‍යතා ප්‍රජාතන්ත්‍රවාදී පරමාදර්ශයේ අතිමූලිකත්වය රැක ගනිමින් තුලනය කිරීමට" කටයුතු කිරීම, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන තොරතුරු දැනගනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ මූලධර්මය සමඟ සැසඳීමේ දී වෙනස් බව අවබෝධ කරගත යුතු වේ.

එබැවින් මහජන මුදල් භාවිතය සැලකිල්ලට ගැනීමේදී පොදු අධිකාරිය විසින් සිදු කර ඇතැයි පවසන මූල්‍ය අක්‍රමිකතා කොමිෂන් සභාව ඉදිරියේ පරීක්ෂාවට ලක් වන බව පැහැදිලිය. මෙම කොමිෂන් සභාව නියෝගය ලබා දීමේදී මහජන සුබසිද්ධිය පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කරනු ඇත. අභියාචකයාගේ ඉල්ලීමෙහි ඇති සෑම අයිතමයක්ම ඉතා සුපරීක්ෂාකාරීව සැලකිල්ලට ගනිමින් මෙම කරුණු ඉදිරිපත් කෙරේ.

**අයිතම අංක 1 සහ 7 සම්බන්ධව (නියෝගයේ සාරාංශය)**

මෙම තොරතුරු පොදු අධිකාරියේ මහජන මුදල් සම්බන්ධ මූල්‍යමය වගකීම සහ විනිවිදභාවයට සෘජුවම සම්බන්ධ වන නිසා අනාවරණය කල යුතු තොරතුරු වේ. මෙම තොරතුරු ලබා දීම වඩාත් වැදගත් වන්නේ පොදු අධිකාරිය රටේ ජාතික ගුවන් සේවය ලෙස සලකන ආයතනය නිසාවෙනි. මෙහි මූල්‍ය කළමණාකරණය සම්බන්ධයෙන් මහජනයාට අවැසි තොරතුරු ලබා දීමට කොමිෂන් සභාව බැඳී සිටියි. මීට අමතරව අයිතම් අංක 1 හි සඳහන් තොරතුරු, 20 (1) (ii) රෙගුලාසි ප්‍රකාරව ප්‍රගාමී ලෙස අනාවරණය කිරීමට පොදු අධිකාරිය බැඳී සිටින බවට අවධාරණය කෙරේ.

අභියාචක විසින් ඉල්ලා සිටින ලද තොරතුරු නම් සඳහන් විධායක නිලධාරීන් තිදෙනෙකුගේ වැටුප් සහ වෙනත් ප්‍රතිලාභ/ දීමනා පිළිබඳ වන හෙයින් මෙය භාරකාර සම්බන්ධතාවයක් පැවතීම මත ප්‍රතික්ෂේප කල නොහැක. තවද, මෙය සේවා ගිවිසුමේ අඩංගු සියලු තොරතුරු පිළිබඳ ඉල්ලීමක් නොවන හෙයින් පොදු අධිකාරිය මෙම තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කල පදනම, එනම් වගන්ති 5(1)(අ) සහ (උ) භාවිතය වලංගු නොවේ.

එහෙයින් මෙම තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීම සඳහා පොදු අධිකාරිය විසින් හුවා දැක්වූ කරුණු මෙම පනතේම වගන්ති 5 (4) දක්වන වකීමට යටත් වන හෙයින් අයිතම් අංක 1 සහ 7 ට අදාළ තොරතුරු ලබා දීමට මෙයින් නියෝග කර සිටිමු.

මෙම තොරතුරු අයිතම්වලට අදාළව නම් කල නිලධාරියාගේ තීරණය ප්‍රතිවර්තනය කරනු ලැබේ.

**අයිතම අංක 2, 3, 4 සහ 5 සම්බන්ධව**

පොදු අධිකාරිය පාකිස්ථාන අන්තර්ජාතික ගුවන් සේවය සමඟ එළැඹි කල්බදු ගිවිසුම (wet lease agreements) කොමිෂන් සභාවේ නිරීක්ෂණයට 26.04.2018 දින ඉදිරිපත් කරනු ලැබූ අතර, 04.08.2016 දිනැති එම කල්බදු ගිවිසුම නිරීක්ෂණය කිරීමෙන් පැහැදිලි වන්නේ රහස්‍යභාවය පිළිබඳ 24.3 වන වගන්තිය එම ගිවිසුමේ 24.3.1 සිට 24.3.3 දක්වා වන අනු වගන්ති වල ව්‍යතිරේකයන්වලට යටත් බවයි.

මෙහි 24.3.2 වන අනු වගන්තියේ මෙසේ සඳහන් වේ. “ *මෙම රහස්‍යභාවය පිළිබඳ වගන්තිය ව්‍යවස්ථාපිත නීති, උසාවි නියෝග සහ ඕනෑම රාජ්‍ය ආයතනයක නියෝගයකට යටත් වේ”* . තවද *Transnet Ltd. and Another v. SA Metal Machinery Co (PTY) Ltd* හි තීරණය වූ පරිදි පොදු අධිකාරියක් මහජන මුදල් භාවිතයෙන් ගිවිසුමක් ප්‍රදානයෙන් අනතුරුව රහස්‍යභාවය පිළිබඳ වගන්තියට ගිවිසුමේ තොරතුරු අනාවරණය කිරීම සීමා කල නොහැකි වේ.

එබැවින්, අභියාචක විසින් ඉල්ලා සිටින තොරතුරු පනතේ 5(1)(ආ)(ii) සහ 5(1)(ඇ) වගන්ති ප්‍රකාරව ප්‍රතික්ෂේප කිරීම නීත්‍යානුකූලව ප්‍රමාණවත් හේතුකාරකයක් නොවන බවට ප්‍රකාශ කර සිටිමු. තවද 5(1)(ආ)(ii) වගන්තිය යටතේ තොරතුරු ප්‍රතික්ෂේප කිරීමට අදාළ කොන්දේසියක් වන “බරපතල අගතියක් සිදුවීම” ඔප්පු කර දැක්වීමට පනතේ 32(4) වගන්තිය සමඟ සලකනු ලැබූ කල පොදු අධිකාරිය විසින් සෑහීමකට පත්වන අයුරකින් කරුණු දැක්වීමට අපොහොසත් වී ඇත.

තවද 5(1)(d) වගන්තිය මඟින් දක්වා ඇති තොරතුරු ප්‍රතික්ෂේප කිරීම 5(4) වගන්තියේ දක්වන මහජන සුභසිද්ධියට යටත් වන හෙයින්, අයිතම් 2, 3, 4 සහ 5 වලට අදාළ තොරතුරු අනාවරණය කල යුතු බවට මෙයින් දන්වා සිටිමු. එනම්; 28.07.2016 දිනැති අවබෝධතා ගිවිසුම, 04.08.2016 දිනැති කල්බදු ගිවිසුම සහ 02.11.2016 දිනැති කල්බදු ගිවිසුම දීර්ඝ කිරීම පිළිබඳ ගිවිසුම වේ.. ඉහත සඳහන් තොරතුරු පනතේ විධිවිධාන යටතේ අනාවරණය කල හැකි තොරතුරු වේ.

මෙම තොරතුරු අයිතම්වලට අදාළව නම් කල නිලධාරියාගේ තීරණය ප්‍රතිවර්තනය කරනු ලැබේ.

**අයිතම අංක 6 සම්බන්ධව**

අභියාචක විසින් ඉල්ලා සිටින තොරතුරු පනතේ 32(4) වගන්තිය සමඟ සලකනු ලැබූ කළ පනතේ 5(1)(ඇ) සහ 5(1)(i) වගන්ති ප්‍රකාරව පොදු අධිකාරිය විසින් තොරතුරු ප්‍රතික්ෂේප කිරීම පිළිගත නොහැක. එනම් 06.08.2016 දින සහ 10.04.2016 දින පොදු අධිකාරිය AerCap ආයතනය සමඟ සමාප්ත කල ගිවිසුම් (Termination Agreements) දෙක පිළිබඳව තොරතුරු පහත සඳහන් කරුණු සැළකිල්ලට ගනිමින් ඉදිරිපත් කල යුතු බවට නියෝග කර සිටිමු.

a. එකී සමාප්ති ගිවිසුම් (Termination Agreements) වල කාර්යය අවසන් වී ඇත. එම නිසා එම ගිවිසුම් වල රහස්‍යභාවය පිළිබඳ ව වගන්ති ඇති පමණින් පනතේ 5(1)(i) සහ 29 වගන්ති සැලකිල්ලට ගෙන තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කල නොහැක. එය සිදු කිරීමට අදාලව 32(4) වගන්තියෙහි සඳහන් ඔප්පු කිරීමේ භාරය ඉටු කිරීමට පොදු අධිකාරිය අපොහොසත් වී ඇත.

b. එහි අන්තර්ගතය අනුව ඉහත සඳහන් ගිවිසුම් වල, සමාප්ති ගාස්තු හා ගෙවීම්, ගිවිසුම් අවසන් කිරීම, පැවරීම ආදිය පිළිබඳව (06.04.2016 දිනැති සමාප්ති ගිවිසුම) සහ AGAT කල් බදු සමාප්ති ගිවිසුම්, ණයවර ලිපි සමාප්ති කිරීම්, අතිරේක කල්බදු සඳහා වන ණය ගිවිසුම්, බෙදාහැරීම් ක්‍රියාවලි කිහිපයක් පිළිබඳ කරුණු ඇතුලත් වේ. මෙම ගිවිසුම් වල මූලික වගන්ති පොදු ආයතනය විසින් සමාප්ති / අවලංගුකිරීමේ ගාස්තු ගෙවීම් පිළිබඳ වේ. එබැවින් මෙම ලේඛන පොදු අධිකාරියට 3 වන පාර්ශවයක් විසින් ලබා දී ඇති රහස්‍ය තොරතුරු ලෙස සලකනු ලබන ආකාරය සහ ඒවා අනාවරණය කිරීම මඟින් AerCap ආයතනයට වන වාණිජමය හෝ තරඟකාරී බලපෑම මෙම කොමිෂන් සභාවට හඳුනාගත නොහැකිය.

c. කෙසේ වෙතත්, ඉහත සඳහන් හේතූන් අනුව, පනතේ 5(1)(ඇ) සහ 5(4) වගන්ති ප්‍රකාරව මෙම තොරතුරු පොදු සුභසිද්ධිය උදෙසාත් මෙමඟින් රටට සිදුවූ මූල්‍යමය පාඩුව අනාවරණය කිරීමටත් ඉදිරිපත් කල හැකිය. එක්සත් රාජධානියේ *Rob Evans v Information Commissioner* (පරිපාලන අභියාචන මණ්ඩලය, [2012] UKUT 313 (AAC)) හි නිරීක්ෂණය කල පරිදි, මහජන සුභසිද්ධිය රාජ්‍ය ප්‍රතිපත්ති සහ පොදු මුදල් භාවිතය සම්බන්ධ කරුණු අනාවරණය කිරීමට ප්‍රභල හේතුකාරකයක් වේ. AerCap ආයතනය සමඟ අත්සන් කරන ලද සමාප්ති ගිවිසුම් අනාවරණය නොකිරීමට තොරතුරු නිලධාරියා ලබා දුන් තීරණය ප්‍රතිවර්තනය කරනු ලැබේ.

කෙසේ වෙතත්, A350 ගුවන් යානා 4 ක් මිලදී ගැනීම සම්බන්ධව පොදු අධිකාරිය 28.06.2013 දින Airbus SAS සමඟ එළැඹී ගිවිසුමට අදාළ ලියකියවිලි අනුකූලව 2020 වර්ෂයේදී ගුවන් යානා තුනක් සහ එක් ගුවන් යානයක් 2021 වර්ෂයේදී ලබා ගැනීමට නියමිතය. මෙම ගිවිසුම තවමත් ක්‍රියාත්මක වෙමින් පවතින අතර පනතේ 5(1) වැනි වගන්තියේ දක්වා ඇති පරිදි එහි "වාණිජමය වශයෙන් සංවේදී තොරතුරු" සලකා බැලිය යුතු අතර, Airbus SAS හි 19.07.2017 දින විද්‍යුත් තැපැල් නිවේදනයෙහි මිල සංශෝධන යාන්ත්‍රණයන් ඇතුළත් වේ.
මෙම තත්ත්වය යටතේ, Airbus SAS සමඟ ගිවිසුමට අදාළ තොරතුරු අනාවරණය නොකිරීමට තොරතුරු නිලධාරියා ගනු ලැබූ තීරණය තහවුරු කෙරේ.

*Seabury, Skyworks* සහ *Nyrus* හි වාර්තා

*Seabury, Skyworks* සහ *Nyrus* හි වාර්තා වල (එම ගුවන් යානා මිලදී ගැනීම හා අවලංගු කිරීම සම්බන්ධ ක්‍රියාවලියෙහි කොටසක් බවට පත් වූ තොරතුරු) මාර්ගජාලය සහ නැව් තක්සේරු කිරීම, මූලෝපායික පොදු ආයතන වල දළ විශ්ලේෂණය සහ ව්‍යාපාර උපදේශන පිළිබඳ පිළිබඳ සවිස්තරාත්මක ඇගයීම සහ වැදගත් තොරතුරු අන්තර්ගත වන බවත්, මෙම තොරතුරු අනාවරණය කිරීම පොදු අධිකාරියේ ව්‍යාපාර කටයුතු වලට අවධානම් සහ තර්ජනයක් වනු ඇති නිසාත්, වාර්තා වල අඩංගු තොරතුරු තරඟකරුවන් විසින් භාවිතා කරනු ලැබුවහොත් පොදු අධිකාරියට බරපතල මූල්‍ය ප්‍රතිවිපාක සහ අහිතකර බලපෑම් ඇති විය හැකි බවත් පොදු අධිකාරිය විසින් පැවසූ නමුත් මේ පිළිබඳ කිසිදු විශේෂිත කරුණක් දක්වා නොමැත.

32 (1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට නම්කළ නිලධාරියාගේ "*තීරණය ස්ථිර කිරීම, වෙනස් කිරීම, හෝ ප්‍රතිවර්තනය කිරීම කල හැකි*" නිසාවෙන් පොදු අධිකාරියට පහත සඳහන් තොරතුරු වාර්තා අභියාචකහට ඉදිරිපත් කිරීමට මෙයින් නියෝග කර සිටිමු. මෙහිදී පොදු අධිකාරිය විසින් පනතේ 5(1)(ඇ) ප්‍රකාරව "*වාණිජ රහස් හෙළිදරවු කිරීම යම් තුන්වන පාර්ශවයක තරඟකාරී තත්ත්වයකට අහිතකර ලෙස බලපානු ඇති*" ලෙස සලකනු ලබන තොරතුරු හැර *Seabury* (පෙබරවාරි 2013), *Skyworks* (22.10.2015 සහ 26.10.2015) සහ *Nyrus* (මාර්තු 18) ට අදාලව ට අනෙකුත් තොරතුරු ඉදිරිපත් කල යුතුය.

පොදු අධිකාරියට තෙවන පාර්ශවයක් විසින් ලබාදුන් පනතේ 5(1)(i) වගන්තිය ප්‍රකාරව රහස්‍යභාවයක් සහිත තොරතුරු යැයි සලකනු ලබන තොරතුරු ඇතුළත්ව ඇති වාර්තා වලින් ඉවත් කොට ලබා දිය හැකි යැයි සැළකෙන තොරතුරු ලබාදීම පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව සිදු කල හැකිය.

තොරතුරු ඉල්ලීම 6 වන අයිතමයේ තොරතුරු ප්‍රදානය මුක්ත කිරීම සම්බන්ධයෙන් පොදු අධිකාරිය පනත ප්‍රකාරව ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් හේතුකාරක වලට සීමා වී, ලබා නොදිය යුතු තොරතුරු වල අන්තර්ගතය පිළිබඳව තීරණය කිරීමට අපි කටයුතු කරමු .

*මෙම ගැටළුව සම්බන්ධයෙන් අදාළ මණ්ඩල වාර්තා සහ පොදු අධිකාරියේ රැස්වීම් වාර්තා*

තොරතුරු ලබා දීම රහස්‍යභාවය, වාණිජමය වටිනාකමක් සහිත වීම හෝ භාරකාර සමබන්ධතාවක් පැවතීම යන පදනම මත ප්‍රතික්ෂේප කලද, එම තොරතුරු වලින් ආරක්ෂා කල යුතු කොටස හැර අනෙකුත් තොරතුරු කොටස් අභියාවකට ලබා දිය හැක. *Shri Suhas Vaidya v Bank of Maharashtra, (File No. CIC/MP/C/2014/900191/SH, File No. CIC/SH/A/2014/001847),* හි උසාවි නියෝගය මඟින්ද මෙසේ තීරණය වන ලදී.

පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට "*එම තීරණය ස්ථිර කිරීම, වෙනස් කිරීම, හෝ ප්‍රතිවර්තනය කිරීම කළ හැකි අතර එම ඉල්ලීම අවශ්‍ය කටයුතු සඳහා අදාළ තොරතුරු නිලධාරියාට නැවත යැවීමට*" ලබා දී ඇති අධිකාරිය භාවිතයෙන් ඉහත සඳහන් තොරතුරු වල පොදු අධිකාරියට තෙවන පාර්ශවයක් විසින් ලබාදුන් පනතේ 5(1)(i) වගන්තිය ප්‍රකාරව රහස්‍යභාවයක් සහිත තොරතුරු යැයි සලකනු ලබන තොරතුරු ඇතුලත්ව ඇති වාර්තා වලින් ඉවත් කොට ලබා දිය හැකි යැයි සැලකෙන තොරතුරු ලබාදීම පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව අභියාවක හට ලබා දීමට මෙයින් නියෝග කර සිටිමු.

තොරතුරු ඉල්ලීම 6 වන අයිතමයේ තොරතුරු හෙළිදරව් කිරීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් පොදු අධිකාරිය ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් හේතු සැළකිල්ලට ගෙන ලබා නොදිය යුතු තොරතුරු වල අන්තර්ගතය තීරණය කිරීම එම හේතුකාරක වලට සීමා කෙරේ.

මෙම නියෝගය ඉදිරිපත් කර සති හතරක කාලයක් තුල පහත සඳහන් තොරතුරු අභියාවකහට ලබාදී නැතහොත් පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව තොරතුරු වලින් කොටසක් ලබාදීමේ හැකියාව පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කරන ලෙසට පොදු අධිකාරියට මෙයින් නිර්දේශ කර සිටිමු.

අ). 01.03.2013 දින බත්තරමුල්ල පිහිටි කථානායක නිවසේ සිදුවූ A350 ගුවන් යානා 4ක් මිලදී ගැනීමට සහ තවත් A350 ගුවන් යානා අතරක් කල්බදු ක්‍රමයට ගැනීමට අදාලව මණ්ඩල රැස්වීමේ වාර්තා.
ආ). 14.03.2013 දිනට අදාලව මණ්ඩල අනුමැතිය ලබාදුන් මණ්ඩල රැස්වීම් වාර්තා; 09.09.2015 දිනට අදාලව AreCap ආයතනය සමඟ A350 ගුවන් යානයක් කල්බදු ක්‍රමයට ලබා ගැනීම සම්බන්ධ සාකච්ඡා කිරීමට අවසර ලබාදීම පිළිබඳ වාර්තා.
ඇ). 2017 නොවැම්බර් මස ලැබීමට නියමිතව තිබූ A350 ගුවන් යානයේ කල්බදු ගිවිසුම සමාප්ත කිරීමට තීරණය කිරීමට අදාළ 09.03.2016 දින මණ්ඩල රැස්වීම් වාර්තා.
ඈ). 2017 ඔක්තෝබර් සහ නොවැම්බර් මස ලැබීමට නියමිතව තිබූ A350 ගුවන් යානයේ කල්බදු ගිවිසුම සමාප්ත කිරීමට තීරණය කිරීමට අදාළ 28.09.2016 දින මණ්ඩල රැස්වීම් වාර්තා.
ඉ). 08.03.2016 දින '*Cancellation of the Lease of One A350-900 aircraft*' සහ '*Termination of the Lease of Three A-350-900 aircraft being delivered on October and November 2016 dated 26th September 2016*' නම් සඳහන් වාර්තා.

තොරතුරු ඉල්ලුමේ 6 වන අයිතමයේ තොරතුරු වලින් කොටසක් අනාවරණය කිරීම සම්බන්ධයෙන් අවශ්‍යතාවයක් පැන නැගෙන අවස්ථාවකදී පොදු අධිකාරිය විසින්එම පැහැදිලි කිරීම් සිදු කිරීමට එකඟවීමට යටත්ව අභියාචනය මෙසේ අවසන් කරන ලදී.

මෙම අභියාචනය සම්බන්ධයෙන් පාර්ශව වෙනුවෙන් පෙනී සිටි නීතීඥයින්ට අපගේ ස්තුතිය පුදකර සිටිමු.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ 27(3) වගන්තියේ කොමිෂන් සභා රීතීන්ට (ගාස්තු සහ අභියාචනා කාර්යයපටිපාටිය), අනුව මෙම නියෝගය අභියාචනයේ පාර්ශවකරුවන් හට ලබාදෙන ලදී.